# දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

# හෝමියෝපති වෛද්‍ය සභාව

## වාර්ෂික වාර්තාව

## 2013

Homoeopathic Medical Council
Samuel Hahnemann
Sri Lanka

# පටුන


| | | පිටුව |
|---|---|---|
| 1. | සාරාංශය | 01 |
| 2. | හැඳින්වීම | 02 |
| 3. | හෝමියෝපති වෛද්‍ය සභාව | 03 |
| 4. | පසුබිම් විස්තරය | 04 |
| 5. | වෛද්‍ය සභාවේ අරමුණු | 07 |
| 6. | වෛද්‍ය සභාව සතු බලතල | 08 |
| 7. | වෛද්‍ය සභාවේ සාමාජිකත්වය සහ ධූර කාලය | 10 |
| 8. | සංස්ථාපිත තොරතුරු | 11 |
| 9. | ක්‍රියාකාරී සැලැස්ම - 2013 | 12 |
| 10. | හෝමියෝපති වෛද්‍ය සභාවේ කාර්ය සාධනය | 14 |
| 11. | විගණන වාර්තාව | 20 |
| 12. | සුභාසිංශන | 21 |

# 01. සාරාංශය

හෝමියෝපති වෛද්‍ය සභාවේ 2013 වාර්ෂික වාර්තාව මෙසේ ඉදිරිපත් කරන අතර මෙම වර්ෂයේ සමස්ත ක්‍රියාකාරීත්වය මෙමඟින් ඇගයීමට ලක්ව ඇත. හෝමියෝපති වෛද්‍ය සභාවේ දැක්ම, මෙහෙවර, අරමුණු, සැලසුම් හා ඉලක්ක වෙත ළඟාවීම සඳහා ගත් සංයුක්ත ක්‍රියා මාර්ග සහ ඒ පිළිබඳව වූ විග්‍රහයක් මෙමඟින් ඉදිරිපත් කෙරේ.

හෝමියෝපති වෛද්‍ය ක්‍රමය ජාතික සෞඛ්‍ය සේවාවක් දක්වා ප්‍රවර්ධනය කිරීම සිය දැක්ම කරගත් හෝමියෝපති වෛද්‍ය සභාවට සිය අරමුණු කරා ළඟා වීම සඳහා ගරු ජනාධිපතිතුමාගේත්, ගරු ඇමතිතුමාගේත්, ගරු නියෝජ්‍ය ඇමතිතුමා ඇතුළු සියළුම මැති ඇමතිවරුන්ගේත් මඟපෙන්වීම අපට වැදගත් වනු ඇත.

2013 වසර අවසන් වන විටත් හෝමියෝපති වෛද්‍ය සභාව පත්කර ගත නොහැකි වූ හෙයින් මෙම වසරේද පෙර වසරේ මෙන්ම සභාව වෙනුවෙන් එහි කටයුතු පවත්වාගෙන යනු ලැබුවේ හෝමියෝපති අතුරු පාලක කමිටුවක් විසිනි. වෛද්‍යවරුන් තිදෙනෙකුගෙන් සමන්විත තාක්ෂණික කමිටුවක සහාය හා නිර්දේශයන් එයට ලැබුණි. මෙම වසර තුළ අතුරු පාලක කමිටුව වෛද්‍ය සභාවේ සාමාන්‍ය කටයුතු පවත්වාගෙන යාමට අමතරව මූලික වශයෙන් ක්ෂේත්‍ර  දෙකක් සම්බන්ධයෙන් සිය කාර්ය සාධනය දියත් කරන ලදී. එකක් නම් වෛද්‍ය සභාවේ කාර්ය මණ්ඩලය බඳවා ගැනීම මඟින් එහි සේවාවන් ප්‍රමාණවත් හා ස්ථාවර තත්ත්වයකට පැමිණවීමය. මේ අනුව කාර්යාල සහායක දෙදෙනෙකු, කළමනාකරණ සහකාර තනතුර සඳහා දෙදෙනෙකු බඳවා ගන්නා ලදී. අතුරු පාලක කමිටුව පත් කිරීමෙන් පසුව මුල්වරට හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයින් ලියාපදිංචි කිරීමට යොමු වීම අනෙක් කාර්ය ක්ෂේත්‍රය ලෙස සඳහන් කළ හැකිය. ඒ අනුව මෙම වසරේදී හෝමියෝපති උපාධිධාරී වෛද්‍යවරුන් 5 දෙනෙකුට ලියා පදිංචිය ලබාදීමත් සමඟ සභාව විසින් ලියාපදිංචි කළ උපාධිධාරීන්ගේ ගණන 8ක් දක්වා ඉහළ දමා ගැනීමට හැකි විය. එමෙන්ම වසර අවසානය වන විට පනතේ 27 (1) C වගන්තිය යටතේ වෛද්‍ය වෘත්තිකයින් ලියා පදිංචි කිරීම සඳහා සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමට කටයුතු කර තිබුණි.

හෝමියෝපති වෛද්‍ය සභාවේ සමස්ත කාර්යයන් අධීක්ෂණය කිරීමත් එයට අවශ්‍ය උපාය උපක්‍රම හඳුන්වා දීමත් කරනු ලබන්නේ  දේශීය වෛද්‍ය අමාත්‍යාංශය විසිනි. සිය වෛද්‍ය ක්‍රමය දියුණු කිරීම සඳහා අවශ්‍ය භෞතික හා මානව සම්පත් සංවර්ධනය අරමුණු කර ගත් හෝමියෝපති වෛද්‍ය සභාවේත්, රේඛීය අමාත්‍යාංශය ලෙස  දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේත් අරමුණු සාක්ෂාත් කිරීම උදෙසා අවස්ථාවක් උදා කිරීම වාර්ෂික වාර්තාව එළි දැක්වීමේ අවසාන අපේක්ෂාව වේ.

# 02. හැඳින්වීම

"සමාන දෙයින් සමාන දෙය නැසීම" යන ස්වාභාවික මූලධර්මය මත පදනම් වූ වෛද්‍ය ක්‍රමයක් ලෙස හෝමියෝපති වෛද්‍ය ක්‍රමය හැඳින්විය හැක. 18 වන ශත වර්ෂයේ ජර්මන් ජාතික විද්‍යාඥයකු වූ ක්‍රිස්ටියන් ෆෙඩ්‍රික් සැමුවෙල් හානිමාන් යන වෛද්‍යවරයා මෙම වෛද්‍ය ක්‍රමයේ නිර්මාතෘ මෙන්ම, වෛද්‍ය ක්‍රමය ව්‍යාප්ත කිරීමටද මහඟු සේවයක් කළ තැනැත්තෙකි. අද දින හෝමියෝපති ක්‍රමය පිළිගත් වෛද්‍ය ක්‍රමයක් ලෙස ලෝකයේ බොහෝ රටවල භාවිත කරයි. උදාහරණයක් ලෙස ඉන්දියානු රජය හෝමියෝපති වෛද්‍ය ක්‍රමය ජාතික සෞඛ්‍ය සේවයට අනුයුක්ත කර, රට පුරා විහිදුනු හෝමියෝපති සායන හා රෝහල් මඟින් හෝමියෝපති ප්‍රතිකාර මහජනතාවට ලබාදේ.

1970 අංක 07 දරණ පනතේ 1 වන කොටසේ, 2 වන වගන්තියේ , 1 වන උප වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා හෝමියෝපති වෛද්‍ය සභාව ස්ථාපනය කර ඇත.

ලියාපදිංචි හෝමියෝපති වෛද්‍යවරුන් අතුරින් තෝරා පත් කර ගනු ලබන හත් දෙනෙකුගෙන් හෝමියෝපති වෛද්‍ය සභාව සමන්විත වේ. ( මේ වන විට හෝමියෝපති වෛද්‍ය සභාව විසුරුවා හැර ඇති අතර එහි කටයුතු අතුරු පාලක කමිටුවක් මඟින් පාලනය වේ.) ලේඛකාධිකාරී හෝමියෝපති වෛද්‍ය සභාවේ ලේකම් වේ.

මෙම සභාව මඟින් මෙහෙය වෙන රජයේ හෝමියෝපති සායන 07 ක් ස්ථාන හතක පිහිටුවා ඇත. දෙහිවල, පරකඩුව,මොණරාගල, පාලමුණෙ, මාතලේ කුරුණෑගල හා තෝලංගමුව එම ස්ථාන වේ.

# 03.හෝමියෝපති වෛද්‍ය සභාව

දැක්ම

“හෝමියෝපති වෛද්‍ය ක්‍රමය ජාතික සෞඛ්‍ය සේවාවක් දක්වා ප්‍රවර්ධනය කිරිම”

මෙහෙවර

“හෝමියෝපති වෛද්‍ය ක්‍රමය අරහයා මානව හා භෞතික සම්පත් වර්ධනය කිරිම සම්බන්ධ නිසි ප්‍රතිපත්ති සම්පාදනය කරමින්, එය පොදු ජනතාව අතර ප්‍රචලිත කිරිම, නඟාසිටුවීම හා අභිවර්ධනය කිරීම.”

පරමාර්ථ

**1970** අංක **07** දරණ හෝමියෝපති පනතේ විධි විධාන වලට අනුකූලව හෝමියෝපති ක්ෂේත්‍රයේ වෘත්තීය අධ්‍යාපන හා සෞඛ්‍ය සේවාව ගුණාත්මකව සංවර්ධනය කිරීම හා දැනුම, කුසලතා හා පළපුරුද්ද සහිත වෘත්තිකයන් මඟින් රෝගීන්ගේ නිරෝගීභාවය ප්‍රතිස්ථාපනය කිරීම හා නිරෝගී පුද්ගලයන්ගේ නිරෝගීභාවය සංරක්ෂණය කිරීම සඳහා වෘත්තීමය නෛතික අධිකාරීත්වය පිරිනැමීම මඟින් වෘත්තීය ගෞරවය හා ගුණාත්මකභාවය සුරක්ෂිත කිරීම.

# 04. පසුබිම

හෝමියෝපති වෛද්‍ය සභාව ප්‍රධාන වශයෙන්ම වෘත්තීමය මණ්ඩලයකි. ප්‍රථම හෝමියෝපති වෛද්‍ය සභාවේ සාමාජිකයන් හෝමියෝපති පනත ප්‍රකාරව විෂය භාර ගරු ඇමතිවරයා විසින් පත් කර ඇත. තදනන්තර වෛද්‍ය සභාවන් සඳහා සාමාජිකයන් ලියාපදිංචි හෝමියෝපති වෛද්‍යවරුන් අතර පවත්වන ඡන්දයක් මඟින් තෝරා පත්කර ගනු ලැබේ. ගරු විෂය භාර ඇමතිතුමාගේ නිර්දේශයන් හා ඇමතිතුමා ප්‍රකාශයට පත්කරන නියෝග වලට අනුකූලව හෝමියෝපති වෛද්‍ය සභාවේ රාජකාරි හා බලතල ක්‍රියාත්මක කළ යුතුය. හෝමියෝපති පනතට අනුව රෙගුලාසි සම්පාදනය කිරීමට හෝමියෝපති වෛද්‍ය සභාවට බලතල ඇත. එම රෙගුලාසි හෝමියෝපති පනතේ නියෝග වලට අනුකූලව ගරු ඇමතිතුමා විසින් ප්‍රකාශයට පත්කළ යුතුය.

## නීති සහ රෙගුලාසි

හෝමියෝපති ක්‍රමය රජය පිළිගත් වෛද්‍ය ක්‍රමයක්ව වසර 40ක පමණ කාලයක්ද, හෝමියෝපති වෛද්‍ය සභාව ස්ථාපිත කර වසර 30 කට වැඩි කාලයක්ද ගතව ඇතත් අවාසනාවකට මෙන් හෝමියෝපති පනත බලාත්මක විමට මෙතෙක් සම්පාදනය කර ඇත්තේ අවශ්‍ය රෙගුලාසි වලින් සුළු ප්‍රමාණයක් පමණි. මෙම තත්ත්වය හෝමියෝපති වෛද්‍ය ක්‍රමයේ දියුණුවට බාධාවක් මෙන්ම පනත අභිබවා යමින් නොයෙක් වංචා සිදුකිරීමටද පිටිවහලක්ව ඇත. තවද මේ නිසා වෛද්‍ය සභාවට තම අභිමතාර්ථ සාක්ෂාත් කර ගැනීමට නොහැකිව ඇති අතර , නිසි ලෙස බලාත්මක වීමටද නොහැකිව ඇත.

## මෙතෙක් ප්‍රකාශයට පත් කළ අනු නීති

1. වෛද්‍ය සභාවේ නීති - 1981
2. හෝමියෝපති රෙගුලාසි - 1980
   (වෛද්‍ය වෘත්තිකයින්ගේ රෙගුලාසි සහ හෝමියෝපති ඖෂධ ආනයනය)
3. හෝමියෝපති සභාවේ නීති - 1983
4. හෝමියෝපති වෛද්‍ය සභා මැතිවරණ රෙගුලාසි - 1998

## හෝමියෝපති වෛද්‍ය සභාව ස්ථාපිත කිරීම

පළමු හෝමියෝපති වෛද්‍ය සභාව 1979 වසරේදී ස්ථාපිත කර ඇත. ගරු ඇමතිතුමා විසින් පනතේ නියෝග වලට අනුව හෝමියෝපති වෛද්‍ය සභාවට සාමාජිකයින් පත්කරමින් හෝමියෝපති පනත බලාත්මක කර ඇත. තදනන්තර වෛද්‍ය සභාවන්හි සාමාජිකයින් හෝමියෝපති පනතේ රෙගුලාසි වලට අනුකූලව හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයන් අතර ඡන්දයක් පවත්වා තෝරා පත් කර ගෙන ඇත. තෙවන හෝමියෝපති වෛද්‍ය සභාව පනතේ නියෝග වලට අනුකූලව වෛද්‍ය සභාවේ සාමාජිකයන් ධූර වලින් පහ කර ඇත.

## හෝමියෝපති වෛද්‍ය සභාවේ සාමාජිකයන්

- ප්‍රථම හෝමියෝපති වෛද්‍ය සභාවේ සාමාජිකයන් ගරු ඇමතිතුමා විසින් පනතේ නියෝග වලට අනුකූලව පත්කරන ලදී. (1979-1989)

- ඉන් පසු වසර 10 ක් පමණ වෛද්‍ය සභා නිලවරණ රෙගුලාසි සම්පාදනය නොකිරීම නිසා වෛද්‍ය සභාව අකර්මන්‍යව පැවතිණ. (1989-1998)

- නිලවරණයක් පවත්වා වසර 5 ක කාල සීමාවකට 1998 සැප්තැම්බර් මස වෛද්‍ය සභාව තෝරා පත් කර ගන්නා ලදී. (1998-2003)

- නැවත වසර 03ක පමණ කාලයක් විෂය භාර අමාත්‍යාංශය මාරුවීම සහ නොයෙකුත් නීතිමය කරුණු නිසා වෛද්‍ය සභාව අකර්මන්‍යව පැවතින. (2003 -2006 )

- තෙවන වෛද්‍ය සභාව 2006 වසරේදී නිලවරණයක් මගින් තෝරා පත් කර ගත් අතර එය 2009 ජූලි මාසය දක්වා පැවතිණ. ගරු අමාත්‍යතුමා 2009 ඔක්තෝබර් මස වෛද්‍ය සභා සාමාජිකයින් ධූර වලින් ඉවත් කර එම තනතුරු සඳහා නව සාමාජිකයින් පත් කරන ලදී.

- ගරු ඇමතිතුමා විසින් 2009/10/29 දිනැති අංක 1625 දරණ විශේෂ ගැසට් නිවේදනයක් අනුව විසුරුවා හරින ලද වෛද්‍ය සභාවේ ඉතිරි වසර දෙක සඳහා වෛද්‍ය සභාවක් පත් කරන ලදී. එම වෛද්‍ය සභාවේ කාලය නිමවීමත් සමඟ 2011 ජනවාරි 30 වන දින එම වෛද්‍ය සභාව අහෝසි විය.

- එතැන් පටන් 2011 ජූනි 16 දින දක්වා වෛද්‍ය සභාවක් නොපැවතුනි.

- ගරු අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය හා ගරු නීතිපතිතුමාගේ උපදෙස් පරිදි ගරු විෂය භාර ඇමතිතුමා විසින් වෛද්‍ය සභාවේ කටයුතු පවත්වාගෙන යාම සඳහා 2011 ජූනි 16 හෝමියෝපති අතුරු පාලක කමිටුවක් පත් කරන ලදී. එතැන් පටන් අද දක්වා වෛද්‍ය සභාවට අයත් කටයුතු ක්‍රියාත්මක කරනු ලබන්නේ අතුරු පාලක කමිටුව මඟිනි.

## 05. වෛද්‍ය සභාවේ අරමුණු

හෝමියෝපති වෛද්‍ය සභාවේ අභිමතාර්ථ පහත සඳහන් පරිදිය.

1. හෝමියෝපති වෛද්‍යවරුන් ලියාපදිංචිය හා ලියාපදිංචිය තාවකාලිකව නැවැත්වීම.

2. හෝමියෝපති වෛද්‍ය ක්‍රමයේ නියමයන් හා වෘත්තීමය ආචාර ධර්ම සුරක්ෂිත කිරීම.

3. හෝමියෝපති වෛද්‍ය ක්‍රමය ව්‍යාප්ත කිරීම සහ ධෛර්යමත් කිරීම මෙන්ම හෝමියෝපති වෛද්‍ය අධ්‍යාපනය වැඩි දියුණු කිරීම.

4. හෝමියෝපති වෛද්‍ය විද්‍යාල හා ආයතන ස්ථාපිත කිරීම සහ නෛතිකව පිළිගැනීම.

5. හෝමියෝපති ඖෂධ හා විලවුන් නිෂ්පාදනය , ආනයනය , වෙළඳාම , පාලනය සහ නියාමනය.

6. හෝමියෝපති වෛද්‍ය ක්‍රමය හා මහජන සෞඛ්‍ය පිළිබඳව දැනුවත් කිරීමට පොත්පත් , සඟරා ප්‍රකාශයට පත් කිරීම.

7. හෝමියෝපති පනතට අනුකූලව නීති සහ ආචාරධර්ම ප්‍රකාශයට පත් කිරීම.

8. හෝමියෝපති පනතේ නියෝග වලට අනුකූලව වෘත්තීමය මණ්ඩලයක් වශයෙන් හෝමියෝපති වෘත්තිකයන්ගේ හා සාමාජික වගකීම් පිළිබඳව ගරු ඇමතිතුමා දැනුවත් කිරීම.

# 06. වෛද්‍ය සභාව සතු බලතල

හෝමියෝපති පනතේ 23 වන නියෝග පරිදි වෛද්‍ය සභාව සතු බලතල පහත සඳහන් පරිදි වේ.

1. හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයන් ලියාපදිංචි කිරීම.

2. අවස්ථානුකූලව හෝමියෝපති වෛද්‍ය විද්‍යාල අනුමත කර පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම.

3. පිළිගත් වෛද්‍ය විද්‍යායතන සඳහා වූ පාඨමාලා විෂය නිර්දේශ හා සංස්කරණ පාඨමාලා සඳහා වූ විෂය නිර්දේශ නියම කිරීම.

4. පිළිගත් වෛද්‍ය විද්‍යායතනයන්හි අධ්‍යාපනය ලබන සිසුන්ට විභාග පවත්වා උපාධි හෝ ඩිප්ලෝමා ප්‍රධානය කිරීම.

5. විභාග ගාස්තු හා ඇතුළත්වීමේ ගාස්තු වශයෙන් මුදල් නියම කර සිටීම සහ අයකර ගැනීම.

6. පිළිගත් වෛද්‍ය විද්‍යායතනයන්හි තත්ත්වය හා ගුණාත්මක වර්ධනය පරීක්ෂා කිරීම, නිරීක්ෂණය කිරීම හා අධ්‍යාපන තත්ත්වයන් පිළිබඳ තහවුරු කිරීම.

7. වෛද්‍ය සභාව විසින් ප්‍රකාශයට පත් කරනු ලබන විභාග පැවැත්වීමට සාමාන්‍ය ලේඛනයේ ලියාපදිංචි වෛද්‍යවරුන් මෙන්ම බාහිර පරීක්ෂක වරුන්ද පත්කිරීම.

8. පනතේ විධිවිධාන හා අපේක්ෂිත නිර්දේශ හා නිර්ණායකයන් අනුව කටයුතු නොකරන වෛද්‍ය විද්‍යායතන තහනම් කිරීම හෝ පිළිගැනීම අත් හිටුවීම. (එසේ කිරීමට පෙර එම ආයතන පාලක සභාවට නිවැරදි කිරීමට අවශ්‍ය වෙනස්කම් කිරීමට අවස්ථාවක් ලබා දිය යුතුය.)

9. හෝමියෝපති පර්යේෂණ ආයතන පිහිටුවීම ,පශ්චාත් උපාධි පාඨමාලා සංවිධානය කිරීම, හෝමියෝපති ඖෂධ නිෂ්පාදනය සඳහා පියවර ගැනීම.

10. හෝමියෝපති සඟරාවන් ප්‍රකාශයට පත් කිරීම.

11. පනතේ අපේක්ෂාවන් හා වෛද්‍ය සභාවේ අරමුණු සඵල කරගැනීම සඳහා හෝමියෝපති අරමුදලේ මුදල් පරිහරණය කිරීම.

12. පනතේ සඳහන් අරමුණු හා හෝමියෝපති වෛද්‍ය ක්‍රමයේ අභිවෘද්ධියට අදාළ වෛද්‍ය සභාවේ අපේක්ෂාවන් ඉටුකිරීම.

13. වෛද්‍ය සභාවේ කාර්යයන් විධිමත්ව ඉටු කිරීමට හා පනතේ විධිවිධාන බලාත්මක කිරීමට රෙගුලාසි සම්පාදනය කර ගරු ඇමතිතුමා විසින් අවශ්‍ය රෙගුලාසි පාර්ලිමේන්තුවෙන් අනුමත කරවා ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත්කිරීම.

## 07. වෛද්‍ය සභාවේ සාමාජිකත්වය සහ ධූර කාලය

හෝමියෝපති වෛද්‍ය සභාවේ සාමාජිකත්වය සභාපතිද ඇතුළුව හෝමියෝපති වෛද්‍යවරුන් හත් දෙනෙකුගෙන් සමන්විත වේ. වෛද්‍ය සභාවේ සාමාන්‍ය ලේඛනයේ ලියාපදිංචි හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයින්ගේ ඡන්දයෙන් හෝමියෝපති වෛද්‍ය සභාවේ සාමාජිකයින් තෝරා පත් කර ගනු ලැබේ. වෛද්‍ය සභාවේ ලේකම් / ලේඛකාධිකාරී පත්කරනු ලබන්නේ වෛද්‍ය සභාව විසිනි. වෛද්‍ය සභාවට තේරී පත් වූ සාමාජික / සාමාජිකාවන් අතරින් වෛද්‍ය සභාවේ සභාපති ගරු ඇමතිතුමා විසින් පත් කරනු ලැබේ.

1970 අංක 07 දරණ හෝමියෝපති පනතට අනුව වෛද්‍ය සභාව නීත්‍යානුකූලව බලාත්මක වනුයේ එය ගරු ඇමතිතුමා විසින් ගැසට් පත්‍රයෙන් ප්‍රසිද්ධ කරනු ලැබීමෙන් පසුවය. වෛද්‍ය සභාව තෝරා පත් කර ගනු ලබන්නේ වසර 05 ක කාලයක් සඳහාය.

## 08. සංස්ථාපිත තොරතුරු

| | | |
|---|---|---|
| ආයතනයේ නම | :- | හෝමියෝපති වෛද්‍ය සභාව. |
| ලිපිනය | :- | අංක 94 ,ෂෙල්ටන් ජයසිංහ මාවත, වැලිසර, රාගම. |
| දුරකථන අංකය | :- | 011-2958175 |
| ෆැක්ස් | :- | 011-2958175 |
| විද්‍යුත් තැපැල | :- | homosri.mcouncil@gmail. Com |
| සංස්ථාපිත ආයතනයේ තත්ත්වය | :- | 1970 අංක 07 දරණ හෝමියෝපති පනතේ 22 හා 23 වගන්ති ප්‍රකාරව බලතල සහ පරමාර්ථ සහිතව හෝමියෝපති වෛද්‍ය සභාව ස්ථාපිත කර ඇත. |
| පරිපාලන ව්‍යුහය | :- | ලේකම් / ලේඛකාධිකාරී<br>කාර්යභාර වෛද්‍යවරු<br>කළමනාකරණ සහකාර<br>ඖෂධ සංයෝජක<br>කාර්යාල සහායක |
| බැංකුකරුවෝ | :- | ලංකා බැංකුව - තැප්‍රොබේන් ශාඛාව, කොළඹ<br>කොමර්ෂල් බැංකුව - ජා ඇල ශාඛාව |

## 09. ක්‍රියාකාරී සැලැස්ම - 2013

**අරමුණ 01**

හෝමියෝපති වෛද්‍ය ක්‍රමය සඳහා නිසි පිළි ගැනිමක් ලබා දීම.

**උපාය මාර්ග**

01. අමාත්‍යාංශයේ නම හෝමියෝපති ද ඇතුළත් වන පරිදි වෙනස් කිරීම.
02. කැබිනට් අනුමැතිය ලබා ගැනීම.

**අරමුණ 02**

හෝමියෝපති පනතේ නියෝග ක්‍රියාත්මක කරමින් හෝමියෝපති වෛද්‍ය සභාව බලාත්මක කිරීම.

**උපාය මාර්ග**

රෙගුලාසි සම්පාදනය කොට ප්‍රකාශයට පත් කිරීම.

**අරමුණ 03**

**හෝමියෝපති මහජන සෞඛ්‍ය සේවාවක් ප්‍රතිස්ථාපනය කිරීම.**

**උපාය මාර්ග**

01. නීති හා රෙගුලාසි සම්පාදනය හා අනුමැතිය.
02. පරිපාලන ව්‍යුහයක් හඳුනා ගැනීම.
03. පත්වීම් දීමේ ක්‍රියාදාමයක් සම්මත කර ගැනිම.
04. ප්‍රතිපාදන වෙන් කිරීම.

**අරමුණ 04**

හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයින් හා ඖෂධ සංයෝජකයින් බිහි කිරීම, දැනුම සහ කුසලතා වර්ධනය.

**උපාය මාර්ග**

01. රෙගුලාසි ප්‍රකාශයට පත් කිරීම.
02. නෛතිකව පිළිගත් ආයතනයක් ලෙස, හෝමියෝපති වෛද්‍ය විද්‍යාලයක් බිහි කිරීම.

**අරමුණ 05**

හෝමියෝපති ඖෂධ හා නිෂ්පාදන පිළිබඳ වෙළඳ පොළ සුලභතාවය තහවුරු කිරීම.

**උපාය මාර්ග**

01. හෝමියෝපති ඖෂධ, ආලේපන සහ උපකරණ පිළිබඳ නීති රීති සම්පාදනය කොට ප්‍රකාශයට පත් කිරීම.
02. අරමුදල් ගොඩ නැගීම සහ රාජ්‍ය හෝමියෝපති ඔසුසල් පිහිටුවීම.

# 10. හෝමියෝපති වෛද්‍ය සභාවේ ක්‍රියාකාරීත්වය
# 2013 ජනවාරි සිට දෙසැම්බර්

## 10-1 සායන කලමනාකරණය සහ පවත්වාගෙන යාම

- වෛද්‍ය සභාව යටතේ දිස්ත්‍රික් 07 ක රජයේ හෝමියෝපති වෛද්‍ය සායන 7 ක් පවත්වාගෙන යාම.
- වෛද්‍ය සභාවේ අධීක්ෂණය යටතේ පවත්වාගෙන යනු ලබන මෙම සායන වලට වැටුප් හා දීමනා ලබා දී ඇත.
- සායන පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය මූලික අවශ්‍යතා ලබා දීමට කටයුතු කරමින් ඇත.
- මෙම සියළුම සායන රජයේ ගොඩනැගිලි කරා ගෙන ඒමට මේ වන විට ක්‍රියා කර ඇත.

### සායන වල කාර්ය සාධනය

වෛද්‍ය සභාව අධීක්ෂණය කරනු ලබන පහත සඳහන් සායන 7 තුළින් රෝගීන් 56290 ක් වර්ෂය තුළ ප්‍රතිකාර ලබාගෙන ඇත.

| | සායනය | රෝගීන් ගණන |
|---|---|---|
| 1. | දෙහිවල | 11556 |
| 2. | මොණරාගල | 5680 |
| 3. | පාලමුනෙයි | 7907 |
| 4. | මාතලේ | 7030 |
| 5. | තෝලංගමුව | 5130 |
| 6. | කුරුණෑගල | 9642 |
| 7. | පරකඩුව | 9345 |

## 10-2 අතුරු පාලක කමිටුව

2013 වසරේද හෝමියෝපති වෛද්‍ය සභාවේ කටයුතු සිදු කරනු ලැබුවේ ගරු ඇමතිතුමා විසින් පත්කරනු ලැබු අතුරු පාලක කමිටුවක් මගිනි.

එහි සාමාජිකයන් වශයෙන්

1. දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ගරු ඇමතිතුමාගේ උපදේශක ආචාර්ය නිව්ටන් පිරිස් මහතා සභාපති

2. දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (සංවර්ධන) පී. දයාරත්න මහත්මිය. - සාමාජිකා

3. බණ්ඩාරනායක ආයුර්වේද පර්යේෂණායතනයේ අධ්‍යක්ෂ මහාචාර්ය කේ. කේ. ඩී. එස්. රණවීර මහතා - සාමාජික

4. හෝමියෝපති රෝහලේ වෛද්‍ය නිලධාරි ඒ. ජේ. එම්. මුනව්වර් මහතා. - සාමාජික

5. දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ප්‍රධාන ගණකාධිකාරී කේ. එස්. පියසිරි මහතා.

### අතුරු පාලක කමිටුවේ වෙනස්වීම්

ප්‍රධාන ගණකාධිකාරිගේ නිලය පුරප්පාඩු වී තිබු බැවින් ඒ සඳහා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ගණකාධිකාරී ඩබ්. ඩබ්. උදාරා ජයමාලි මහත්මිය කමිටු සාමාජිකාවක් වශයෙන් සහභාගි විය.

## අතුරු පාලක කමිටු රැස්වීම්

01. 2013.01.17 - 15

02. 2013.02.28 - 16

03. 2013.05.20 - 17

04. 2013.07.09 - 18

05. 2013.08.29 - 19

06. 2013.10.04 - 20

07. 2013.11.26 - 21

(වර්ෂය තුල පැවැත්වීමට හැකියාව ලැබුණේ අතුරු පාලක කමිටු රැස්වීම් 7 ක් පමණි.)

## 10-3 හෝමියෝපති වෛද්‍ය සභාවේ කාර්ය මණ්ඩලයේ වෙනස්වීම් සහ නව බඳවා ගැනීම්

| තනතුර | සංඛ්‍යාව | |
|---|---|---|
| 01. ලේඛකාධිකාරී | 01 | |
| 02. පරිපාලන නිලධාරි | 01 | ( 2013.03.31 සේවා කාලය අවසන් විය) |
| 03. වෛද්‍ය වෘත්තික | 07 | |
| 04. කළමනාකරණ සහකාර | 02 | |
| 05. ඖෂධ සංයෝජක | 07 | (මොණරාගල සායනයේ පැවති පුරප්පාඩුව සඳහා 2013.10.15 දින ඖෂධ සංයෝජක වරියක් බඳවා ගන්නා ලදී.) |
| එකතුව | 18 | |

## 10-4 බඳවා ගැනීමේ පටිපාටිය හා කාර්ය මණ්ඩල වෙනස්වීම්

- හෝමියෝපති වෛද්‍ය සභා කාර්යාලය සඳහා දෛනික වැටුප් ගෙවීමේ පදනම මත අනියම් කාර්යාල සහායකයින් දෙදෙනෙකු 2013.02.15 දින බඳවා ගන්නා ලදී.

- හෝමියෝපති වෛද්‍ය සභා පරිපාලන නිලධාරී ලෙස කොන්ත්‍රාත් පදනම මත කටයුතු කල පී.ඒ. පියසේන මහතාගේ සේවය 2013.03.31 දිනෙන් අවසන් විය.

- හෝමියෝපති වෛද්‍ය සභා කාර්යාලයේ කළමනාකරණ සහකාර තනතුරට පත්කිරීමට පැවැත්වූ සම්මුඛ පරීක්ෂණයෙන් තෝරා ගන්නා ලද එන්.පී.ජී. ජයත්‍රි පියුමලී පල්ලියගුරු, පී.ඒ.දීපිකා නිරෝෂා හේරත් යන දෙදෙනා 2013.06.10 වන දින සිට සේවයෙහි පිහිටුවන ලදී.

- හෝමියෝපති වෛද්‍ය සභාව මඟින් මෙහෙයවනු ලබන, මොණරාගල රජයේ හෝමියෝපති වෛද්‍ය සායනයේ තාවකාලික ඖෂධ සංයෝජක තනතුරට පත් කිරීමට පැවැත්වූ සම්මුඛ පරීක්ෂණයෙන් තෝරා ගන්නා ලද එල්. රසිකා චාන්දනී මෙනෙවිය 2013.10.15 වන දින සිට සේවයෙහි පිහිටුවන ලදී.

## 10-5 දත්ත හා කාලීන තොරතුරු

2013 වසර දක්වා ලියාපදිංචි වී ඇති වෛද්‍යවරුන්ගේ නාම ලේඛනය

| කාණ්ඩය | උපාධිධාරී | ඩිප්ලෝමාධාරී | සාමාන්‍ය | ලියාපදිංචි වූ මුළු වෛද්‍යවරු |
|---|---|---|---|---|
| 27-1-a | 04 | 52 | | 56 |
| 27-1-c | | | 36 | 36 |
| 27-2 | | | 49 | 49 |
| 27-5 | | | 51 | 51 |
| එකතුව | 04 | 52 | 136 | 192 |

සාරාංශය

| | ලියාපදිංචිය ලත් වෛද්‍යවරු | විධිමත් ලෙස ලියාපදිංචි නොවූ | 2013 වසර සඳහා ලියාපදිංචිය යාවත්කාලීන කල | 2013 වසර සඳහා ලියාපදිංචිය යාවත්කාලීන නොකල | මිය ගිය ගණන |
|---|---|---|---|---|---|
| මුළු ගණන | 192 | 01 | 99 | 51 | 41 |

## 10 - 6 ඖෂධ ආනයනය සඳහා වෛද්‍ය වෘත්තිකයින් වෙනුවෙන් බලපත්‍ර නිකුත් කිරීම

- 2013 ජනවාරි සිට දෙසැම්බර් 30 දක්වා ඖෂධ ආනයනය සඳහා ඉදිරිපත් කරනු ලැබූ ඉල්ලීම් 20 කට අනුමැතිය ලබා දී ඇත.
- ඒවායෙහි මුළු වටිනාකම

| | |
|---|---|
| US $ | 33578.27 |
| INDIAN RS | 208106.00 |
| € | 15.60 |

- නව හෝමියෝපති ඖෂධ 3 ක් නිෂ්පාදනය සඳහා අනුමැතිය ඉල්ලා ඇත. එලදායී නිෂ්පාදනයක් බිහිකිරීම සඳහා අවශ්‍ය උපදෙස් ලබා දී ඇත.

## 10-7 අධිකරණ කටයුතු

### ශ්‍රේෂ්ඨාධිකරණය

ගරු ශ්‍රේෂ්ඨාධිකරණයේ පවරා ඇති 891/2009 අංක දරණ නඩුව විභාග වෙමින් පවතී.

2008 දෙසැම්බර් මස තාවකාලික ලියාපදිංචිය ලත් හෝමියෝපති වෛද්‍යවරුන් සාමාන්‍ය ලේඛනයේ ලියාපදිංචි කිරීම සඳහා හෝමියෝපති අතුරු පාලක කමිටුව වෙත නියෝගයක් ලබා දෙන ලෙස ඉල්ලා ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොණු කළ 187/2013 (F/R) නඩුවේ තීන්දුව 2013/06/13 වන දින ලබා දුණි. එමගින් පැමිණිලිකරුවන්ගේ ඉල්ලීමට ඉඩදෙමින් මාස 06 ක් ඇතුළත අදාළ විභාගය පවත්වා ලියාපදිංචි කිරීම සඳහා කටයුතු කිරීමටත්, එමෙන්ම ඒ සඳහා ලියාපදිංචිය අවසන් වීමට තිබූ 2013/11/30 දින පටන් මාස 06 ක් ඉදිරියට ඒ අයගේ තාවකාලික ලියාපදිංචි කාලය දීර්ඝ කිරීමටත් නියෝග කරන ලදී.

### අභියාචනාධිකරණය

හෝමියෝපති වෛද්‍යවරුන් ලියාපදිංචි කිරීමට එරෙහිව වෛද්‍යවරු තිදෙනෙකු විසින් ගරු ඇමතිතුමා, අමාත්‍යාංශ ලේකම්, හෝමියෝපති වෛද්‍ය සභාව, ලේඛකාධිකාරී, අතුරු පාලක කමිටුව සහ නීතිපතිතුමා විත්තිකරුවන් ලෙස නම් කරමින් ගරු අභියාචනාධිකරණයේ පවරා තිබූ නඩුව තව දුරටත් විභාග වෙමින් තිබුණි.

තාවකාලික වෛද්‍යවරුන් ලෙස 2008 දෙසැම්බර් ලියාපදිංචි කර තිබූ වෛද්‍යවරුන් තිදෙනෙකු විසින් ඒ අයව ස්ථිර වෛද්‍යවරුන් ලෙස ලියාපදිංචි කිරීම සඳහා විභාගයක් පැවැත්වීම වෛද්‍ය සභාවක් පත්වන තෙක් නවත්වන ලෙස අතුරු පාලක කමිටුව වෙත වළක්වන තීන්දුවක් ලබා දෙන ලෙස ගරු අභියාචනාධිකරණයේ ගොණුකර තිබූ නඩුව වසර අවසානය තෙක් අවසන් නොවීය.

### දිසා අධිකරණය

හෝමියෝපති වෛද්‍ය සභාවේ හිටපු කාර්යාල සයායක ඊ. එම්. ආර්. ඩී. සේරම් යන අය සිය සේවය නතර කිරීමට එරෙහිව මිලියන 03 ක් ඉල්ලා 13953/M අංක දරණ මීගමුව දිසා අධිකරණයේ පවරා ඇති නඩුව විභාග වෙමින් පවතී.

# 11. විගණන වාර්තාව

පෙර වසරේදී මෙන්ම 2013 වසරේදී ද හෝමියෝපති වෛද්‍ය සභාවේ කටයුතු හෝමියෝපති අතුරු පාලක කමිටුවක් විසින් මෙහෙය වන ලදී . මෙහි මූල්‍ය කටයුතුද අමාත්‍යාංශය මඟින්ම මෙහෙය වනු ලැබීය. මේ සමග අමුණා ඇති 2013 වසරේ ගිණුම් වාර්තා, ආදායම් හා වියදම් විගණනයට ඉදිරිපත් කෙරුණු අතර විගණන විමසුම්, ඒවාට සැපයූ පිළිතුරු සමග විගණකාධිපතිගේ වාර්තාවද මේ සමග ඉදිරිපත් කෙරේ.

2013 වසර සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කරන ලදී. එමෙන්ම හෝමියෝපති සභාවේ 2013-2017 සංයුක්ත සැලැස්ම සකස් කර අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කෙරුණි. පෙර දෙවසර තුළ පරිපාලන කටයුතු වලට සීමා වී තිබූ තත්ත්වයෙන් වෙනස් වෙමින් මෙම වසරේදී හෝමියෝපති අතුරු පාලක කමිටුව වෛද්‍යවරුන් ලියාපදිංචි කිරීම යළි ආරම්භ කරන ලදී. මේ අනුව හෝමියෝපති උපාධිධාරී වෛද්‍යවරුන්/වරියන් පස්දෙනෙකුට ලියාපදිංචිය ලබා දුනි. හෝමියෝපති සභාවේ භෞතික හා මානව සම්පත් වර්ධනය කිරීමේ ක්‍රියාවලිය ඉදිරියට ගෙන යමින් කාර්ය මණ්ඩලය සඳහා කළමනාකරණ සහකාර ස්ථිර තනතුරට දෙදෙනෙකු බඳවා ගන්නා ලදී.

අතුරු පාලක කමිටුවේ කටයුතුවලට එරෙහිව ගරු අධිකරණයේ නඩු පවරා තිබූ බැවින් යම් සීමාවන් යටතේ ක්‍රියා කිරීමට එයට සිදු විය. මෙය ක්‍රියාකාරී සැලැස්මේ සමහර කොටස් ක්‍රියාවට නැංවීමට පැවති එක් ප්‍රධාන බාධාවක් වූ බව සඳහන් කළ යුතුය.

නව හෝමියෝපති පනත සම්මත කර ගැනීමේ කටයුතු කඩිනමින් සිදු කෙරෙමින් ඇත. නව පනත සම්මත වූ වහාම හෝමියෝපති සභාව යළි පත් කෙරෙනු ඇත. හෝමියෝපති පනතෙහි දැක්වෙන අරමුණු කරා බාධාවකින් තොරව ගමන් කිරීමට මග විවර කර ගැනීම මෙහි අභිප්‍රාය වේ.

ආචාර්ය නිව්ටන් ඒ. පීරිස්
සභාපති
හෝමියෝපති අතුරු පාලක කමිටුව

# සුභාසිංශන

★★★★

ගරු සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා

ගරු  නියෝජ්‍ය අමාත්‍යතුමා

වෛද්‍ය සභා සාමාජිකයින්

ලේකම්තුමා සහ අතිරේක ලේකම්තුමියන්

හෝමියෝපති අතුරු පාලක කමිටුවේ සභාපතිතුමිය

අතුරු පාලක කමිටු සාමාජිකයන් / සාමාජිකාවන්

නීතිපති දෙපාර්තමේන්තුව

විගණකාධිපති දෙපාර්තමේන්තුව

හෝමියෝපති වෛද්‍ය සභාවේ ලේඛකාධිකාරී

හා

කාර්ය මණ්ඩලය

# හෝමියෝපති වෛද්‍ය සභාව

## මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

## 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

| | 2013 | 2012 |
|---|---|---|
| | රු. | රු. |
| **ආදායම** | | |
| රජයේ පුනරාවර්තන ප්‍රතිපාදන | 5806790 | 5518399 |
| වාර්ෂික ගාස්තු | 11850 | 2800 |
| වෙනත් ආදායම (1 සටහන) | 134789 | 115641 |
| **මුළු ආදායම** | 5953429 | 5636840 |
| **වියදම්** | | |
| වැටුප් වේතන හා සේවක ප්‍රතිලාභ (2 සටහන) | 4866152 | 4595815 |
| සැපයුම් හා පාරිභෝජන ද්‍රව්‍ය (3 සටහන) | 8354 | 11012 |
| ක්ෂය හා ක්‍රම ක්ෂය | 119310 | 133064 |
| වෙනත් වියදම් (4 සටහන) | 868477 | 918105 |
| නීති ගාස්තු | 142000 | - |
| මූල්‍ය පිරිවැය (බැංකු ගාස්තු) | 8994 | 8149 |
| **මුළු වියදම්** | 6013287 | 5666145 |
| **කාලච්ඡේදය සඳහා ඌනතාවය** | (59858) | (29305) |

මෙම මූල්‍ය ප්‍රකාශණය සකස් කිරීමේ සහ ඉදිරිපත් කිරීමේ වගකීම හෝමියෝපති අතුරු පාලක කමිටුව විසින් දරනා බව සහතික කරමු.

| | | | |
|---|---|---|---|
| ලේඛකාධිකාරී | සභාපති | කමිටු සමාජික | සකස් කළේ, |
| හෝමියෝපති වෛද්‍ය සභාව | හෝමියෝපති වෛද්‍ය සභාව | එම්.ටී.ආර්.සී චිත්‍රලතා | කේ. එස්. පියසිරි |

25

| | | |
|---|---|---|
| **(1) සටහන - වෙනත් අයභාර** | | |
| විවිධ ආදායම් | 22370 | 13775 |
| බැංකු පොලී | 112419 | 101866 |
| | 134789 | 115641 |
| **(2) සටහන - වැටුප්, වේතන හා සේවක ප්‍රතිලාභ** | | |
| කාර්ය මණ්ඩල වැටුප් හා දීමනා | 4035084 | 3844620 |
| සේවක අර්ථ සාධක අරමුදල් | 722668 | 455606 |
| සේවා නියුක්ති භාර අරමුදල් | 108400 | 113901 |
| සේවක වන්දි | - | 181688 |
| | 4866152 | 4595815 |
| **(3) සටහන - සැපයුම් හා පාරිභෝජන ද්‍රව්‍ය** | | |
| ලිපිද්‍රව්‍ය වියදම් | 7134 | - |
| සංග්‍රහ වියදම් | 1220 | 11012 |
| | 8354 | 11012 |
| **(4) සටහන - වෙනත් වියදම්** | | |
| විවිධ වියදම් | 24421 | 134487 |
| ගමන් වියදම් | 38586 | 48111 |
| බෙහෙත්ශාලා ගාස්තු | 152626 | 164199 |
| තැපැල් ගාස්තු | 6000 | 11060 |
| වෛද්‍ය සභා රැස්වීම් ගාස්තු | 116000 | 136000 |
| විගණන ගාස්තු | 40000 | 40000 |
| ජල ගාස්තු | 43176 | 13599 |
| විදුලිය ගාස්තු | 13419 | 6357 |
| දුරකථන ගාස්තු | 49196 | 45042 |
| මුද්‍රණ ගාස්තු | 140345 | 35000 |
| දැන්වීම් ගාස්තු | 89152 | 125664 |
| කාර්යාල උපකරණ අලුත්වැඩියාව | 101523 | 113154 |
| සුලු මුදල් වියදම් | 33727 | 45432 |
| දැයට කිරුල වියදම් | 20306 | - |
| | 868477 | 918105 |

**(5) සටහන - ගිණුම් ඉදිරිපත් කිරීම**

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් කරණ ප්‍රමිති (2009) හි අංක "01" ට අනුව වේ. එසේ ම එහි **"ස්වභාවය මත වියදම් වර්ගීකරණය විදහා පෑම"** යන පරිදි ඉදිරිපත් කර ඇත.

26

# හෝමියෝපති වෛද්‍ය සභාවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

| | 2013 |
|---|---|
| | රු. |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහයන්** | |
| **ලැබීම්** | |
| රජයෙන් ලැබුණු පුනරාවර්තන ප්‍රදානයන් | 5806790 |
| බැංකු පොලී | 112419 |
| අනෙකුත් ලැබීම් (1 සටහන) | 34220 |
| **ගෙවීම්** | |
| සේවක පිරිවැය (2 සටහන) | (4828813) |
| බැංකු පොලී (බැංකු ගාස්තු) | (8994) |
| අනෙකුත් ගෙවීම් (3 සටහන) | (977977) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | 137645 |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහයන්** | |
| රජයෙන් ලැබුණු "ප්‍රාග්ධන" ප්‍රතිපාදනයන් | 973273 |
| පිරියත හා උපකරණ මිලට ගැනීම (4 සටහන) | (973273) |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | - |
| මුදල් හා මුදල් හා සමාන දෑ වල ශුද්ධ වැඩිවීම (5 වන සටහන) | 137645 |
| කාල පරිච්ඡේදය ආරම්භවූ මුදල් හා මුදල් හා සමාන දෑ (6 වන සටහන) | 1690450 |
| කාල පරිච්ඡේදය අවසානයේ මුදල් හා මුදල් හා සමාන දෑ (7 වන සටහන) | 1828095 |

මෙම මූල්‍ය ප්‍රකාශණය සකස් කිරීමේ සහ ඉදිරිපත් කිරීමේ වගකීම හෝමියෝපති අතුරු පාලක කමිටුව විසින් දරනා බව සහතික කරමු.

| | | | |
|---|---|---|---|
| ලේඛකාධිකාරී | සභාපති | කමිටු සමාජික | සකස් කළේ, |
| හෝමියෝපති වෛද්‍ය සභාව | හෝමියෝපති වෛද්‍ය සභාව | එම්.ටී.ආර්.සී චිත්‍රලතා | කේ. එස්. පියසිරි |

| | |
|---|---|
| **(1) සටහන් - අනෙකුත් ලැබීම්** | |
| විවිධ ආදායම් | 22370 |
| වාර්ෂික ගාස්තු | 11850 |
| | 34220 |
| **(2) සටහන් - සේවක පිරිවැය** | |
| අර්ථ සාධක අරමුදල් | 705118 |
| සේවා නියුක්ති භාර අරමුදල් | 105767 |
| සේවක වැටුප් හා දීමනා | 4017928 |
| | 4828813 |
| **(3) සටහන - අනෙකුත් ගෙවීම්** | |
| ගමන් වියදම් | 36533 |
| බෙහෙත් ශාලා වියදම් | 150826 |
| ලිපි ද්‍රව්‍ය | 7134 |
| වෛද්‍ය සභා රැස්වීම් | 96000 |
| දැන්වීම් ගාස්තු | 89152 |
| විදුලිය ගාස්තුව | 13208 |
| දුරකථන ගාස්තු | 53738 |
| මුද්‍රණ ගාස්තු | 185345 |
| කාර්යාල උපකරණ අලුත්වැඩියාවන් | 84779 |
| ජලය | 33588 |
| සංග්‍රහ වියදම් | 1220 |
| සුලු මුදල් වියදම් | 33727 |
| විවිධ වියදම් | 24421 |
| නීති ගාස්තු | 142000 |
| තැපැල් ගාස්තු | 6000 |
| දියට කිරුළ සඳහා වියදම් | 20306 |
| | 977977 |
| **(4) වන සටහන - පිරියත හා උපකරන මිලට ගැනීම** | |
| පා පැදියක් මිලට ගැනීම | 10845 |
| වතුර පිල්ටරයක් මිලට ගැනීම | 8600 |
| ගොඩනැගිලි පුනරුත්තාපන (වැඩි දියුනු කිරීම) වියදම් | 953828 |
| | 973273 |
| **(5) වන සටහන - මුදල් හා මුදල් හා සමාන දෑ වල ශුද්ධ වැඩිවීම** | |
| වර්ෂය අවසාන මුදල් ශේෂය | 1828095 |
| වර්ෂය ආරම්භක මුදල් ශේෂය | (1690450) |
| | 137645 |

28

| | |
|---|---|
| **(6) වන සටහන - කාලච්ඡේදය ආරම්භයේ වූ මුදල් හා මුදල් හා සමාන දෑ** | |
| කොමර්ෂල් බැංකුව | 1301742 |
| ලංකා බැංකුව | 388708 |
| | 1690450 |
| **(7) වන සටහන - කාලච්ඡේදය අවසානයේ මුදල් හා මුදල් හා සමාන දෑ** | |
| කොමර්ෂල් බැංකුව | 1405167 |
| ලංකා බැංකුව | 422928 |
| | 1828095 |
| **(8) වන සටහන** | |
| **සාමාන්‍ය ක්‍රියාකාරකම් වලින් ශුද්ධ අතිරික්ත/(ඌනචතාවය), මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය සමග සැසඳීම** | |
| - සාමාන්‍ය ක්‍රියාකාරකම් වලින් ශුද්ධ අතිරික්ත/ඌනතාවය | (59858) |
| **මුදල් නොවන වෙනස්වීම්** | |
| ක්ෂය වීම් | 119310 |
| ගෙවිය යුතු වියදම් වැඩිවීම (9 සටහන) | 130310 |
| පෙර වර්ෂයේ ගැපුම් ගිණුමේ 'වාර්ෂික" වෙනස්වීම් | (52116) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | 137646 |

**(9) වන සටහන - ගෙවිය යුතු වියදම් වැඩිවීම**

| | **2012 හා 2013 වර්ෂයන් සැසඳීම** | | |
|---|---|---|---|
| | **වාර්ෂික අඩුවීම්** | **වාර්ෂික වැඩිවීම්** | **ශුද්ධ වෙනස්වීම (+) / (-)** |
| - ගෙවිය යුතු අර්ථ සාධක අරමුදල් | - | 17550 | |
| - ගෙවිය යුතු සේවා නියුක්ති අරමුදල් | - | 2633 | |
| - ගෙවිය යුතු බෙහෙත් ශාලා ගාස්තු | - | 1800 | |
| - ගෙවිය යුතු වෛද්‍ය සභා රැස්වීම් | - | 20000 | |
| - ගෙවිය යුතු විගණන ගාස්තු | - | 45616 | |
| - ගෙවිය යුතු දුරකථන ගාස්තු | (3342) | - | |
| - ගෙවිය යුතු විදුලිය | - | 513 | |
| - ගෙවිය යුතු ගමන් වියදම් | - | 2053 | |
| - ගෙවිය යුතු ජල ගාස්තු | - | 9588 | |
| - ගෙවිය යුතු කාර්ය මණ්ඩල වැටුප් හා දීමනා | - | 17155 | |
| - ගෙවිය යුතු කාර්යාල උපකරණ අලුත්වැඩියාව | - | 16744 | |
| | (3342) | 133652 | 130310 |

29

# හෝමියෝපති වෛද්‍ය සභාව

## 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශණය

| | 2013 | 2012 |
|---|---|---|
| | රු. | රු. |
| **වත්කම්** | | |
| **ජංගම වත්කම්** | | |
| මුදල් හා මුදල් සමාන දෑ (1 සටහන) | 1828095 | 1690450 |
| | 1828095 | 1690450 |
| **ජංගම නොවන වත්කම්** | | |
| පිරියත හා උපකරණ (2 සටහන) | 874958 | 974822 |
| ගොඩනැගිලි පුනරුත්තාපන වියදම | 953828 | - |
| | 1828786 | 974822 |
| **මුළු වත්කම්** | 3656881 | 2665272 |
| **බැරකම්** | | |
| **ජංගම බැරකම්** | | |
| ගෙවිය යුතු දෑ (3 සටහන) | 235284 | 104974 |
| **ජංගම නොවන බැරකම්** | - | - |
| **මුළු බැරකම්** | 235284 | 104974 |
| **ශුද්ධ වත්කම්** | 3421597 | 2560298 |
| | 3656881 | 2665272 |
| **ශුද්ධ වත්කම් / ස්කන්ධය** | | |
| ප්‍රාග්ධනය | 2562144 | 2562144 |
| රජයේ ප්‍රාග්ධන ප්‍රතිපාදනය | 973273 | - |
| සමුච්චිත ඌනතාවය | (89163) | (29305) |
| පෙර වර්ෂයේ ගැලපුම් ගිණුම | (24657) | 27459 |
| ශුද්ධ වත්කම් / ස්කන්ධය | 3421597 | 2560298 |

මෙම මූල්‍ය ප්‍රකාශණය සකස් කිරීමේ සහ ඉදිරිපත් කිරීමේ වගකීම හෝමියෝපති අතුරු පාලක කමිටුව විසින් දරනා බව සහතික කරමු.

| | | | |
|---|---|---|---|
| ............................ | ............................ | ............................ | ............................ |
| ලේඛකාධිකාරී | සභාපති | කමිටු සමාජික | සකස් කළේ, |
| හෝමියෝපති වෛද්‍ය සභාව | හෝමියෝපති වෛද්‍ය සභාව | එම්.ටී.ආර්.සී චිත්‍රලතා | කේ. එස්. පියසිරි |

| | | |
|---|---|---|
| **(1) සටහන - මුදල් හා මුදල් සමාන දෑ** | | |
| කොමර්ෂල් බැංකුව | 1405167 | 1301742 |
| ලංකා බැංකුව | 422928 | 388708 |
| | 1828095 | 1690450 |
| **(2) සටහන - පිරියත හා උපකරණ** | | |
| පිරියත හා උපකරණ - (ගත්මිල) | 1725992 | 1706547 |
| (-) සමුච්චිත ක්ෂය | (851034) | (731725) |
| ශුද්ධ අගය | 874958 | 974822 |
| **(3) සටහන - ගෙවිය යුතු දෑ** | | |
| ගෙවිය යුතු අර්ථ සාධක අරමුදල් | 17550 | - |
| ගෙවිය යුතු සේවා නියුක්ති භාර අරමුදල් | 2633 | - |
| ගෙවිය යුතු බෙහෙත් ශාලා ගාස්තු | 16200 | 14400 |
| ගෙවිය යුතු වෛද්‍ය සභා, රැස්වීම් ගාස්තු | 20000 | - |
| ගෙවිය යුතු විගනන ගාස්තු | 85616 | 40000 |
| ගෙවිය යුතු දුරකථන ගාස්තු | 3937 | 7279 |
| ගෙවිය යුතු විදුලිය | 1240 | 727 |
| ගෙවිය යුතු ගමන් වියදම් | 2053 | - |
| ගෙවිය යුතු ජල ගාස්තු | 10156 | 568 |
| ගෙවිය යුතු කාර්ය මණ්ඩල වැටුප් හා දීමනා | 59155 | 42000 |
| ගෙවිය යුතු කාර්යාල උපකරණ අලුත්වැඩියාව | 16744 | - |
| | 235284 | 104974 |

<u>**(4) සටහන - ගිණුම් ඉදිරිපත් කිරීම**</u>

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරන ප්‍රමිති (2009) අංක "01" ට අනුවය

<u>**(5) සටහන - ක්ෂය ක්‍රමය**</u>

- සෑම ස්ථාවර වත්කමක්ම ක්ෂය කර ඇත්තේ හීනවන ශේෂ ක්‍රමය පදනම් කරගෙන වේ.
- ක්ෂය අනුපාතය 12%
- වත්කම්, වර්ෂයේ කුමන දිනයක මිලදී ගත්තද එය අදාල සම්පූර්ණ වර්ෂය සඳහාම ක්ෂය ගණන් බලනු ලැබේ.
- වත්කම්, වර්ෂයේ කුමන දිනයක ඉවත් කලද එය සඳහා ක්ෂයවීම ගණන් බලනු නොලැබේ.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
**AUDITOR GENERAL'S DEPARTMENT**

මගේ අංකය / எனது இல. / My No. } එච්එම්/බී/එච්එම්සී/1/13/02 ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2014 දෙසැම්බර් 31 දින

සභාපති,

හෝමියෝපති වෛද්‍ය සභාව.

හෝමියෝපති වෛද්‍ය සභාවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

---

හෝමියෝපති වෛද්‍ය සභාවේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර සභාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතුයැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් 2014 ඔක්තෝබර් 28 දින සභාවේ සභාපති වෙත නිකුත් කරන ලදී.

1.2 <u>මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම</u>

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, . - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

32

1.3 <u>විගණකගේ වගකීම</u>

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI -1000- 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන

ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරිවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුලත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුලත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරි බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 <u>තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම</u>

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට හෝමියෝපති වෛද්‍ය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයට අදාල වෛද්‍ය සභා රැස්වීම් ගාස්තු, කාර්ය මණ්ඩල දීමනා හා වැටුප් හා විගණන ගාස්තු වෙනුවෙන් රු.66,859 ක් අඩුවෙන් ප්‍රතිපාදනය කර තිබුණි.

(ආ) අයහාර ස්වරූපයේ වියදම් රු.27,020 ක් ප්‍රාග්ධන වියදම් සේ සලකා ගොඩනැගිලි හා පුනරුත්ථාපන ලෙස ගිණුම්ගත කර තිබුණි.

### 2.3 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) මුදල් රෙගුලාසි 756 | සමාලෝචිත වර්ෂය සඳහා වෛද්‍ය සභාවේ භාණ්ඩ සමීක්ෂණයක් පවත්වා නොතිබුණි. |
| (ආ) මුදල් රෙගුලාසි 395(ඇ) | එක් එක් මාසය අවසානයේදී ඇති ගනුදෙනු තත්ත්වය සම්බන්ධයෙන් ඊලඟ මාසයේ 15 දිනට පෙර බැංකු සැසඳුම් ප්‍රකාශයක් පිළියෙල කළ යුතු වුවද, එයට අදාලව කටයුතු කර නොතිබුණි. |

3. <u>මූල්‍ය සමාලෝචනය</u>

3.1 <u>මූල්‍ය ප්‍රතිඵල</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය තුළදී සභාවේ කටයුතුවල මෙහෙයුම් ප්‍රතිඵලය රු. 59,858 ක ඌනතාවක් විය. එයට එරෙහිව ඉකුත් වර්ෂය සඳහාද රු.29,305 ක ඌනතාවයක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි තවදුරටත් 30,553 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි.

3.2 <u>ආයතනයට එරෙහිව ඇති නෛතික සිද්ධි</u>

බාහිර ආයතන(කණ්ඩායම්) 3 ක් විසින් වෛද්‍ය සභාව විසුරුවා හැරීම, සේවයෙන් පහකිරීම හා සේවය අවසන් කිරීම නිසා එකතුව රු. 3,200,000 ක වන්දි ඉල්ලා ආයතනයට එරෙහිව අධිකරණවල නඩු තුනක් ගොණුකර තිබුණි.

4. <u>මෙහෙයුම් සමාලෝචනය</u>

4.1 <u>කාර්යසාධනය</u>

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) නීත්‍යානුකූල වෛද්‍ය සභාවක් නොතිබීම හේතුවෙන් 1970 අංක 07 දරන හෝමියෝපති පනතේ 22 වගන්තියේ සඳහන් පහත දැක්වෙන අරමුණු ඉටුකර ගැනීමට සමාලෝචිත වර්ෂය තුළදීද නොහැකි වී තිබුණි.

   i. හෝමියෝපති වෛද්‍ය ක්‍රමය සඳහා පර්යේෂණ හා අධ්‍යයන ධෛර්යමත් කිරීම.

   ii. හෝමියෝපති ඖෂධ නිෂ්පාදනය, ආනයනය, විකිණීම හා බෙදාහැරීම සඳහා ව්‍යවස්ථා සම්පාදනය කිරීම.

   iii. හෝමියෝපති වෛද්‍ය විද්‍යාලයක් ආරම්භ කිරීම සඳහා 2008 වර්ෂයේදී ගොඩනැගිල්ලක් ඉදිකර 2009 වර්ෂයේදී ලී බඩු සම්පාදනය කරගෙන තිබුණද, වෛද්‍ය විද්‍යාලයේ අධ්‍යයන කටයුතු ආරම්භ කිරීමට අදාළ නීතිමය රාමුව සකස් කර අදාළ කාර්යය ඉටු කිරීමේ කටයුතු සිදු කිරීමට 2013 දෙසැම්බර් 31 දිනටද පියවර ගෙන නොතිබුණි.

(ආ) දිවයිනේ ප්‍රදේශ හතක් තුළ පවත්වාගෙන යනු ලබන වෛද්‍ය සායන හතෙන් රෝගී සහභාගීත්වය, පරකඩුව සායනයෙහි සියයට 8 කින්ද, මොණරාගල සායනයෙහි සියයට 13 කින්ද, කුරුණෑගල සායනයෙහි සියයට 9 කින්ද අඩු වී තිබුණි.

(ඇ) <u>වෛද්‍යවරුන් ලියාපදිංචි කිරීම</u>

i. වෛද්‍ය සභාව විසුරුවා හැරුණු 2011 ජනවාරි 31 දින වනවිට වෛද්‍යවරුන් 191 ක් ලියාපදිංචි කර තිබුණු අතර, 2013 වර්ෂයේ අතුරු පාලක කමිටුවේ නිර්දේශ මත නැවත වරක් වෛද්‍යවරුන් 05 දෙනෙකු ලියාපදිංචි කර තිබුණි. ඒ පිළිබඳ විස්තර පහත දැක්වේ.

| ලියාපදිංචියට අදාළ පනතේ වගන්තිය | විස්තරය | ලියාපදිංචි කර තිබූ වෛද්‍යවරු සංඛ්‍යාව | | |
|---|---|---|---|---|
| | | 2011 දෙසැම්බර් 31 දිනට | 2012 දෙසැම්බර් 31 දිනට | 2013 දෙසැම්බර් 31 දිනට |
| <u>1970 අංක 07 දරන හෝමියෝපති පනත</u> | | | | |
| I. 27(1)(අ) | හෝමියෝපති වෛද්‍ය විද්‍යාව පිළිබඳ වසර හතරකට නොඅඩු පාඨමාලාවක් හදාරා තිබීම. | 54 | 54 | 54 |
| II. 27(1)(ආ) | ශ්‍රී ලංකාවේ හෝ පිටරටක පිළිගත් හෝමියෝපති ආයතනයක් විසින් නිකුත් කරන ලද ඩිප්ලෝමා සහතිකයක් හෝ උපාධි සහතිකයක් ලබා තිබීම | - | - | 5 |
| III. 27(1)(ඇ) | වසර 10 කට නොඅඩු කාලයක් හෝමියෝපති වෛද්‍ය වෘත්තියේ නියැලී සිටින සභාව විසින් පිළිගත් වෛද්‍යවරුන් | 35 | 35 | 35 |

| | | | | |
|---|---|---|---|---|
| IV. 27(2) | වසර 3 කට නොඅඩු කාලයක් වෛද්‍ය වෘත්තියේ නියැලී සිට ඇති හා සභාව විසින් පවත්වනු ලබන ලිඛිත විභාගයකට පෙනී සිට සුදුසුකම් ලැබූ වෛද්‍යවරුන් | 50 | 50 | 50 |
| V. 27(5) | තාවකාලික ලැයිස්තුවේ නම් ඇතුළත් වෛද්‍යවරුන්ට ලිඛිත විභාගයකින් පසුව ස්ථිර ලියාපදිංචිය ලබාදීම | 52 | 52 | 52 |
| | | 191 | 191 | 196 |

2013 දෙසැම්බර් 31 දින වනවිට ඉහත පරිදි ලියාපදිංචි වෛද්‍යවරුන් 196 න් වෛද්‍යවරුන් 38 දෙනෙක් මියගොස් තිබුණි.

ii. විදේශ රටක පිළිගත් හෝමියෝපති ආයතනයක් විසින් නිකුත් කරන ලද උපාධි සහතිකයක් මත වෛද්‍ය ලියාපදිංචිය සිදු කිරීම මීට ප්‍රථම සිදු කර නොතිබුණු අතර, සමාලෝචිත වර්ෂයේදී ඉන්දියානු උපාධි සහතිකය මත වෛද්‍යවරු පස් දෙනෙකුගේ ලියාපදිංචිය සිදු කර තිබුණි.

### 4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

2012 ජනවාරි 05 දිනැති අතුරු කමිටු රැස්වීමේදී වෛද්‍ය සායන හතක් සඳහා පොදු නියෝග මාලාවක් සැකසීමට තීරණය කර තිබුණද, 2013 දෙසැම්බර් 31 දිනටද ඒ සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි.

### 4.3 නිෂ්ක්‍රිය වත්කම්

හෝමියෝපති වෛද්‍ය විද්‍යාලය සඳහා 2009 වර්ෂයේදී මිලදීගෙන තිබූ රු. 1,199,254 ක් වටිනා ස්ථාවර වත්කම්ද, අමාත්‍යාංශය සතු ගොඩනැගිල්ලද 2013 දෙසැම්බර් 31 දින වනවිටත් නිෂ්ක්‍රියව පැවතුණි.

5. <u>ගිණුම් කටයුතුභාවය සහ ඉදිරිපත් කිරීම</u>

5.1 <u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම</u>

හෝමියෝපති වෛද්‍ය සභාවේ 2013 වර්ෂය තුළදී අතුරු පාලක කමිටුවක් යටතේ ක්‍රියාත්මක වූ අතර සභාවේ සියලු වියදම් දේශීය වෛද්‍ය අමාත්‍යාංශය විසින් අදාළ වැය ශීර්ෂය යටතේ සිදු කර තිබුණි. එබැවින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අමාත්‍යාංශය විසින් සිදු කරන ලද සියලු වියදම්වල එකතුවට සමාන මුදලක් වෛද්‍ය සභාවට ලබාදුන් ප්‍රතිපාදන ලෙස සලකා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණි.

5.2 <u>සංයුක්ත සැලැස්ම</u>

2003 ජූනි 02 දිනැති පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5:1:3 ඡේදය ප්‍රකාරව සභාව විසින් අනුමත කරනු ලැබූ යාවත්කාලීන කරන ලද සංයුක්ත සැලැස්මේ පිටපත් අදාළ මුදල් වර්ෂය ආරම්භ වීමට දින 15 කට ප්‍රථම අදාළ අමාත්‍යාංශය, භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තුමේන්තුව සහ විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවද යාවත්කාලීන කරනු ලැබූ 2013 -2017 සංයුක්ත සැලැස්ම නිමකර තිබුණේද 2013 ජූලි මාසයේදීය. එසේම ඉහත පරිදි අදාළ ආයතන වෙත යොමුකර නොතිබුණි.

5.3 <u>ක්‍රියාකාරී සැලැස්ම</u>

2013 දෙසැම්බර් 31 දිනට, වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් අරමුණු ඉටුකර ගැනීමේ ප්‍රගතිය පහත පරිදි විය.

(අ) හෝමියෝපති වෛද්‍ය ක්‍රමය සඳහා නිසි පිළිගැනීමක් ලබාදීම සඳහා ප්‍රතිකාර ලබාදීම තුළින් මහජන විශ්වාසය ගොඩනැගීම සඳහා ජංගම සායන 15 ක් පැවැත්වීමට සැලැසුම් කර තිබුණද සායන 07 ක් පමණක් පවත්වා තිබුණි.

ප්‍රතිකාර ලබාගත් සහ නොගත් ජනයා තුළ විශ්වාසය තහවුරු කිරීම අරභයා සාකච්ජා සහ සම්මන්ත්‍රණ 05 ක් සහ පාසැල් වැඩසටහන් 05 ක් සංවිධානය කිරීමට සැලැසුම් කර තිබුණද එම කටයුතු සිදු කර නොතිබුණි. එසේම වෛද්‍යවරුන් අතර සුහදත්වය සහ සහයෝගිතාවය තහවුරු කිරීම සඳහා සාකච්ජා සහ සම්මන්ත්‍රණ 05 ක් සංවිධානය කිරීමට සැලැසුම් කළද එයද සිදු කර නොතිබුණි.

(ආ) හෝමියෝපති පනතේ නියෝග ක්‍රියාත්මක කරමින් හෝමියෝපති වෛද්‍ය සභාව බලාත්මක කිරීම වෙනුවෙන් නිතී රීති සඳහා පාර්ලිමේන්තුවේ සහ අදාල ඇමතිතුමාගේ අනුමැතිය ලබා ගැනීමටද, ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කිරීමටද අරමුණු කර තිබුණද, එම අරමුණද 2013 දෙසැම්බර් 31 දින වන විටත් ඉටු කිරීමට නොහැකි වී තිබුණි.

(ඇ) හෝමියෝපති මහජන සෞඛ්‍ය සේවාවක් ප්‍රතිස්ථාපනය කිරීමට අරමුණු කර තිබුණද එයද ඉටු කිරීමට අපොහොසත් වී තිබුණි.

(ඇ) හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයන් බිහිකිරීම හා පරිපූරක වෛද්‍යවරුන් බිහිකිරීම සහ ඔවුන්ගේ දැනුම හා කුසලතා වර්ධනය කිරීම වෙනුවෙන් අතුරු නීති සම්පාදනය, පිළිගැනීම සහ හෝමියෝපති වෛද්‍ය විද්‍යාලය පිහිටුවීමට සැලැසුම් කර තිබුණද, එම අරමුණද ඉටු කිරීමට නොහැකි වී තිබුණි.

(ඉ) හෝමියෝපති ඖෂධ හා නිෂ්පාදන පිළිබඳ වෙළඳපොල සුලභතාවය තහවුරු කිරීම සඳහා අතුරු නීති සම්පාදනය සහ හෝමියෝපති බෙහෙත් ගබඩා සහ ඔසුසල් පිහිටුවීම සඳහා අරමුදල් ගොඩනැගීමට සැලැසුම් කර තිබුණද සැලැසුම් ක්‍රියාත්මක කර නොතිබුණි.

5.4 අයවැය ලේඛනමය පාලනය

පහත සඳහන් කරුණු අනුව අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේදී වෛද්‍ය සභා රැස්වීම් ගාස්තු රු. 116,000 ක් ද, මුද්‍රණ ගාස්තු රු. 140,345 ක් ද, දැන්වීම් ගාස්තු රු. 89,152 ක් ද, විගණන ගාස්තු රු. 40,000 ක් ද, කාර්යාල උපකරණ අළුත්වැඩියා වියදම් රු. 101,523 ක් ද, නීති ගාස්තු රු. 142,000 ක් ද වැය කර තිබුණු නමුත් එම විෂයන් වෙනුවෙන් වාර්ෂික අයවැය ඇස්තමේන්තුවේ ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ආ) අයවැය ලේඛනගත වියදම් හා තථ්‍ය වියදම් අතර විෂයන් 02 කට අදාලව සියයට 100 කද, එක් විෂයකට අදාලව සියයට 81 කද විචලනයන් පැවතුණි.

5.5 වාර්ෂික වාර්තා සභාගත කිරීම

2011 සහ 2012 වර්ෂයේ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගතකර නොතිබුණි.

5.6 පොදු ව්‍යාපාර කාරක සභා නියෝග ඉටු නොකිරීම

2010 සැප්තැම්බර් 15 දිනැති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සාකච්ඡා සටහන ප්‍රකාරව වර්තමාන තතත්වයට ගැලපෙන පරිදි සභාවේ රෙගුලාසි යාවත්කාලීන කළයුතු බවට නියෝග කර තිබුණද, වර්තමානයේදීද වෛද්‍ය සභාවක් පත්කර නොතිබීම හේතුවෙන් 2013 දෙසැම්බර් 31 දින වන විටත් එම රෙගුලාසි යාවත්කාලීන කර නොතිබුණි.

6. <u>පද්ධති හා පාලන</u>

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) ලේඛන පවත්වාගැනීම

(ආ) ගිණුම්කරණය

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති (වැඩබලන)